(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

**අංක 3(6).]**

# පාර්ලිමේන්තුවේ අංක 3 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2021 මාර්තු 22 සඳුදා**

## දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

*

ගරු අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යුහයේ හා නීති රීතිවල ප්‍රතිසංස්කරණ හඳුනාගැනීමටත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

ඒ අනුව, පවත්නා මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යුහයේ හා නීති රීතිවල ප්‍රතිසංස්කරණ හඳුනාගැනීමත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන යෝජනා කිරීමත් අත්‍යවශ්‍ය වන හෙයින් ද;

(අ) දැනට පවත්නා මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යුහයේ හා නීති රීතිවල පවතින අඩුපාඩු හඳුනාගැනීම සඳහා; සහ

(ආ) ඒ සම්බන්ධයෙන් කළ යුතු සංශෝධන නිර්දේශ කිරීම සඳහා

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

2.

(අ) එහි සභාපතිවරයා සහ සභික මන්ත්‍රීවරයන් කථානායකවරයා විසින් පත්කරනු ලැබිය යුතු ය;

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101 ප්‍රකාරව, එම කාරක සභාව සාමාජිකයන් පහළොස් (15) දෙනෙකුගෙන් සමන්විත විය යුතු ය; සහ

(ඇ) එම කාරක සභාවේ වාර්තාව එහි පළමු රැස්වීමේ දින සිට මාස හයක (6) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කරනු ලබන එවැනි කාල පරිච්ඡේදයක් ඇතුළත දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

3. එම කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකු කැඳවීමටද, යම් ලේඛනයක් හෝ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමට ද, ඉහත සඳහන් කරුණු පූර්ණ ලෙස සලකා බැලීම පිණිස අවශ්‍යයැයි කාරක සභාව කල්පනා කරන ලිඛිත හෝ වාචික සාක්ෂි ලබා ගැනීමට හා භාරගැනීමට ද;

(ඇ) කාරක සභාවේ සහය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබාගැනීමට ද; සහ

(ඇ) කලින් කල අතුරු වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යෑමට ද

බලය තිබිය යුතු ය.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***